# රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

# මිල ගණන් කැඳවීමයි

ප්‍රසම්පාදන අංකය - DMC/FIN/2021 (PROCU: 47)

ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.19 සේවක ප්‍රතිලාභ ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ ආගණනය කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් මිල ගණන් කැඳවීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත මගින් පිහිටුවන ලද රජයේ ව්‍යවස්ථාපිත ආයතනයකි. ආයතනයේ මූල්‍ය වාර්ථා පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සිදු කරනු ලැබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2021.12.31 දිනට සිටින සේවක සංඛ්‍යාව 298ක් වන අතර දැනට සේවක විශ්‍රාම පාරිතෝෂික ගණනය කිරීම සේවක පාරිතෝෂික පනත අනුව සිදු කරනු ලැබේ. අපේක්ෂිත උපදේශන සේවා සහ ආගණනය කිරීම් 2021.12.31 දිනට වන ගිණුම් පියවීම් කටයුතු අනුව සිදුකර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 සේවක ප්‍රතිලාභ ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය උපදේශනයක් සහ ආගනණයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් මෙම මිල ගණන් කැඳවීම සිදුකරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් ඔබ ආයතනය උනන්දුවක් දක්වන්නේ නම් ඒ සඳහා වන මුද්‍රා තැබූ මිල ගණන් 2021.12.28 දින පෙ.ව.10.30 ට හෝ ඊට පෙර "සේවක පාරිතෝෂික දීමනාව ගණනය කිරීම" යනුවෙන් ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රසම්පාදන ඒකකය, මුදල් අංශය, 3වන මහළ, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ ප්‍රසම්පාදන ඒකකයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත ගෙනවිත් බහාලන මෙන් කාරුණිකව දන්වමි.

තවද, මිල ගණන් ඉදිරිපත් කිරීමේදී, සේවා ගාස්තු අය කරන ආකාරය පැහැදිලිව දක්වා, කෙටි පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන ලෙසත්, මේ සම්බන්ධයෙන් ඔබගේ ඇති වෘත්තීය පළපුරුද්ද සහ ඔබ ආයතනය විසින් සේවා සපයා ඇති, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන පිළිබඳව විස්තරයක් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

එමෙන්ම, මිල ගණන් ඉදිරිපත් කිරීමට පෙර, අප ආයතනය පිළිබඳව තවදුරටත් තොරතුරු දැනගත යුතු නම්, ඒ පිළිබඳව දුරකථන අංක 077 494 0343 මගින් ගිණුම් නිලධාරී, සංජය ජයසිංහ මහතා ඇමතීම මගින් ලබාගත හැකි බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
විද්‍යා මාවත
කොළඹ 07.

The Director General of the Disaster Management Center has decided to call for bids from interested parties regarding the calculation of employee gratuity at the Disaster Management Center for the year 2021.